ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
நீர் வழங்கல் மற்றும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சு
MINISTRY OF WATER SUPPLY AND ESTATE INFRASTRUCTURE DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My Ref } FIN/01/01/03

ඔබේ අංකය / உமது இல. / Your Ref }

දිනය / திகதி / Date } 2024.08. 28.

Secretary

Office of the Leader of the House

Parliament of Sri Lanka

Sri Jayawardanepura, Kotte

Submission of observations and action taken by the Minister in charge of the institutions with regard to the report presented to Parliament by the Committee on Public Accounts – Pertaining to the Special Spending Units, Ministries, Department, Provincial Councils and Local Government Institutions

(Parliamentary series No : 79)

This refers to your letter dated 04th July 2024 regarding the above subject.

02. Accordingly, the report prepared in all 03 languages including 02 CDs (PDF) which contains my observations and the action taken on the matters pertaining to my Ministry is forwarded herewith to be submitted to the Parliament.

Jeevan Thondaman (M.P.)

Minister of Water Supply and Estate Infrastructure Development

නො. 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැළවත්ත, බත්තරමුල්ල.
இல. 35, "லக்திய மெதுர", புதிய பாராளுமன்ற வீதி, பெலவத்தை, பத்தரமுல்ல.
No. 35, "Lakdiya Medura", New Parliament Road, Pelawatta, Battaramulla.

දුරකථන / தொலைபேசி / Telephone } 011 2177240, 011 2177241

ෆැක්ස් / தொலைநகல் / Fax } 011 2177242

E-mail : secretary@mws.gov.lk
Web : www.mws.gov.lk

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத்தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர்: நீர் வழங்கல் மற்றும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No:79

Name of the institution :Ministry of Water Supply and Infrastructure Development

Submission of observations of the Hon.Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of the standing Oder No.119(4)

ජල සම්පාදන අමාත්‍යාංශය

<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79</u>

<u>පළමු කොටස 89.00</u>

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබාගෙන ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මනා අධීක්ෂණයකින් යුතුව මෙම කාරණය සිදු කිරීමට සියලු නිලධාරින්ට උපදෙස් දී ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා පිළිබඳව මේ වන විට කටයුතු සිදුකර ඇත.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	ජල සම්පාදන මණ්ඩලය හා ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙත ලබා දී තිබූ වාහනවලට අදාල ලියාපදිංචි සහතික මේ වන විට අප වෙත ලැබී ඇත. අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචි වී ඇති නමුත් තවමත් අපවෙත ලියාපදිංචි සහතික නොලැබී ඇති වාහන 03ක් සම්බන්ධව තොරතුරු සොයාගැනීමට මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැත.	මේ වනවිට අමාත්‍යාංශ සංචිතයේ ධාවනය කරන සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අලවා ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	පිළිගනිමි. එම අවස්ථාවෙහි අපහරණයට නියමිතව තිබුණු වාහන 03ක් නැවත අලුත්වැඩියා කරගෙන භාවිතය සඳහා අර්ධ රාජ්‍ය ආයතනයක් වන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දෙන ලදී. අයිතිය මාරු කිරීමට අවශ්‍ය පැවරීමේ ලේඛනද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මේ වන විට අමාත්‍යාංශය තුළ ගර්හිත ලෙස හඳුනාගත් වාහන නොමැත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	වර්තමානයේ දී අනුමත ප්‍රතිපාදන තුළ පමණක් බැඳීම් වලට එළඹීමට කටයුතු කර ඇත.

අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මේ වන විට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අනුමත සීමාව ඉක්මවා නොමැත. අනුමත කාර්ය මණ්ඩලය - 154 වර්තමාන කාර්ය මණ්ඩලය - 114 පුරප්පාඩු ප්‍රමාණය - 40 පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

ජල සම්පාදන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දෙවැනි කොටස 62.00

සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	පිළිගනිමි.2022 වර්ෂය සඳහා සකස් කර නොතිබූ බව සඳහන් කරමි. 2023 වසර සඳහා අදාල කටයුතු ආරම්භ කර තිබූ අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) මඟින් (2023.11.30) වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත. ඒ අනුව 2023 සහ 2024 වසරට අදාලව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට පියවර ගෙන නොමැත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කොරෝනා වසංගතය හේතුවෙන් 2021 හා 2022 වසරවල අපේක්ෂා කළ පරිදි පුහුණු අවස්ථා නොතිබිණි. 2023 වසරට අදාළව පුහුණු අවස්ථා 80%ක් ලබා දී ඇති ඇත. එසේ වුවද මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ 01/2024හි 05 වගන්තිය මඟින් පුහුණුවීම් සඳහා දේශීය අරමුදල් වැය කිරීම සීමා කර ඇති බැවින් 2024 වසර සඳහා ඉතා සීමිත ලෙස පුහුණුවීම් සිදු කර ඇත.

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	නියමිත නීත රීති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස සියලුම නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර එමඟින් හිතකර මතයක් ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාර්ය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	2023 හා 2024 වර්ෂ වල කාර්යසාධක දර්ශක 03 ක් බැගින් හඳුනාගෙන ප්‍රකාශයට පත් කර ඇත. (එහි ප්‍රගතිය ඇමුණුම 01 මගින් ඉදිරිපත් කර ඇත.)
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	අදාල නිර්දේශ හැකි සෑම විටම ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. 2023 වසරේ දී විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලදි.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍යාංශ නිලධාරීන්ගේ පත්වීම් බලධාරයා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වන බැවින් ස්ථාන මාරු ලබා දිය යුත්තේද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසිනි. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් ස්ථානමාරු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත නිර්දේශ කර යවා ඇත. එසේ වුවද ස්ථාන මාරු ලබා දී නොමැත. නිසි පරිදි අනුප්‍රාප්තිකයන් සහිතව හැරෙන්නට නිලධාරීන් තනතුරුවලින් නිදහස් කිරීමට මෙවන විට අමාත්‍යාංශයේ ඇතිව තිබෙන පුරප්පාඩු ප්‍රමාණය අනුව හැකියාවක් නොමැත.

ජීවන් තොන්ඩමන්

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

ඇමුණුම 01

2023 වර්ෂය

කාර්ය සාධන දර්ශක	ඒකකය	2023		
		ඉලක්කය	ප්‍රගතිය	ප්‍රගතිය %
1. ගෘහස්ථ නල මාර්ග ජල සැපයුම් ආවරණය වැඩි කිරීම	නල ජල සම්බන්ධතා සංඛ්‍යාව	140,441	106,967	76.16
2. නල මලාපවහන පහසුකම් ආවරණය වැඩි කිරීම	අප ජල සම්බන්ධතා සංඛ්‍යාව	867	338	38.98
3. ආදායම් නොලබන ජල සැපයුම් අඩු කිරීම	%	24	25.14	8.06

2024 වර්ෂය

කාර්ය සාධන දර්ශක	ඒකකය	2024 වසර 2 වන කාර්තුව දක්වා ඉලක්කය	ප්‍රගතිය 2024. 06.30 දිනට
1. ගෘහස්ථ නල මාර්ග ජල සැපයුම් ආවරණය වැඩි කිරීම	නල ජල සම්බන්ධතා සංඛ්‍යාව	62,440	56843
2 නල මලාපවහන පහසුකම් ආවරණය වැඩි කිරීම	අප ජල සම්බන්ධතා සංඛ්‍යාව	583	425
3 ආදායම් නොලබන ජල සැපයුම අඩු කිරීම	%	25.07	24.33